**සේවක අර්ථසාධක අරමුදල - 2017**

-----------------------------------------------------

සේවක අර්ථසාධක අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6 (3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6 (3) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

-------------------------------------

(i) ප්‍රමිතයේ 07 ඡේදය ප්‍රකාරව, අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්වය වෙත ගලා ඒමේ හව්‍යතාවයක් ඇති විට පමණක් වත්කම් ලෙස හඳුනාගත යුතු වුවද, ඒ පිළිබඳව සලකා බැලීමෙන් තොරව ප්‍රාග්ධන වැය විෂයයන් 2 ක් යටතේ දරා තිබූ යන්ත්‍ර අලුත්වැඩියා වියදම් රු.1,029,145 ක් හා වාහන අලුත්වැඩියා වියදම් රු. 3,172,415 ක් සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාග්ධනීත කර තිබුණි. තවද වාහන අලුත්වැඩියා සඳහා 2013 වර්ෂයේ සිට එසේ දරන ලද වියදම මත සියයට 20 බැගින් ක්ෂය ප්‍රතිපාදනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය වටිනාකමද රු. 1,804,446 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ රු. 209,264,405 ක් වටිනා ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද, ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් යටතේ නිරූපනය කළ යුතු වුවද 2017 වර්ෂය තුළදී මිලදීගෙන තිබූ රු.4,626,366 ක් වටිනා මෘදුකාංග, පරිගණක හා උපාංග යටතේ දක්වා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට පෙර මිලදී ගත් අස්පෘශ්‍ය වත්කම් වසර 2 ක් තුළදී ක්‍රමක්ෂය කළ යුතු බවට අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ලෙස හඳුනාගෙන තිබුනද ඊට පටහැනිව එම වත්කම් වසර 4 ක් පුරා ක්‍රමක්ෂය කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීම තුලින් අයකරගෙන නිරවුල් කරන තෙක් කම්කරු දෙපාර්තමේන්තුවට අයත් එක් එක් දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල පොදු තැන්පත් ගිණුම්වල රඳවා තිබූ දායක මුදල් රු. 100,583,388 ක් අරමුදල විසින් ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) අරමුදලේ සාමාජික අරමුදල තුල කම්කරු කොමසාරිස් නමින් ගිණුමක දීර්ඝ කාලයක සිට පවත්වාගෙන එන සේවායෝජකයන්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකර ගෙන තිබූ 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10,756 ක් වූ මුදල සහ එසේ නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තුරු පොදු තැන්පත් ගිණුමක රඳවා තිබූ 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 378 ක්වූ මුදල එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමට මෙම වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණි. තවද 2017 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් රු.මිලියන 779 ක් සහ අඩු වැඩි දායක මුදල් වශයෙන් රු.මිලියන 1,647 ක් සාමාජික අරමුදල යටතේ දක්වා තිබුණද එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් තව දුරටත් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2013 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය ගිණුම්කාරක සභා නිර්දේශ අංක 7 (ii) ප්‍රකාරව ඉහත සඳහන් රු.මිලියන 10,756 ක මුදල් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට හැකි නව පරිගණක මෘදුකාංගයක් හඳුන්වාදීමේ කටයුත්තක නිරතව සිටින බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් කමිටුවට දන්වා තිබුණද, මෙම වාර්තාවේ දින වන විටත් පරිගණක මෘදුකාංගයක් හඳුනාගෙන නොතිබුණි. කෙසේ වුවද, 2015 වර්ෂය අවසානයට රු.මිලියන 8,142 ක් වූ එම ශේෂය පිළිවෙලින් 2016 හා 2017 වර්ෂ අවසානයන්ට රු.මිලියන 10, 979 ක් හා රු.මිලියන 10,756 ක් වූයෙන් එම ශේෂයේ වර්ධනය වන තත්ත්වයක් දක්නට තිබුණි.

(ii) ඉහත දක්වා ඇති පරිදි පොදු තැන්පත් ගිණුමක රඳවා තිබූ රු.377,716,250 ක් වූ මුදල සාමාජික ගිණුම්වලට බැර නොකිරීම හේතුවෙන් සාමාජිකයින්ට හිමි විය යුතු පොලී ආදායම ද අහිමි වී තිබුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් දක්වා තිබූ රු. මිලියන 779 ක් සහ අඩු වැඩි දායක මුදල් ගිණුමේ ශේෂය රු. මිලියන 1,647 ක් වූ ශේෂ නිරවුල් කරන ලෙස 2013 වර්ෂයේ සිට දිගින් දිගටම රාජ්‍ය ගිණුම් කාරක සභා මගින්ද නියෝග කර තිබුණද එපරිදි කටයුතු කර නොතිබූ අතර වාර්ෂිකව මෙම ශේෂ වැඩිවන බැවින් සහ පොලී හිමි නොවන බැවින් මෙම ශේෂ අප්‍රමාදව නිරවුල් කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම කෙරෙහි අරමුදලේ අවධානය යොමුවීම අත්‍යවශ්‍ය කරුණක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු. 1,946,676 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 7 කට අදාළව වසර 10 කට අධික කාලයක සිට බැංකු සැසඳුම්වල අගරු වූ නිකුත් කළ චෙක්පත්, අගරු වූ තැන්පත් කළ චෙක්පත්, තැන්පත් කළ චෙක්පත්, මුදල් පොතේ සටහන් නොවූ මුදල් තැන්පතු, සෘජු හර/බැර හා හඳුනානොගත් අනෙකුත් ශේෂ ලෙස රු. 1,413,749,124 ක් සහ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල්/මුදල් ඇණවුම්, උපලබ්ධි නොවූ චෙක්පත් හා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස එකතුව රු.1,479,240,883 ක් දක්වා තිබූ නමුත් මෙම ශේෂ හඳුනාගෙන ගැලපීම් කිරීමට මෙම වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) 2016 වර්ෂයේ දී සිදු වූ ගිණුම්කරණ දෝෂයක් හේතුවෙන් පැනනැගී තිබූ රු. 285,108,000 ක් වූ ආදායම් බදු ශේෂය සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමකින් තොරව තවදුරටත් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් බාණ්ඩ 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.881,432,176 ක් වුවද, ඉදිරිපත් කල උපලේඛනය අනුව එම ශේෂයන්ගේ එකතුව රු.537,780,607 ක් වූයෙන් රු. 343,651,569 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට අක්‍රීයව පැවති බැංකු ජංගම ගිණුම් 2 ක බැංකු තහවුරුව අනුව ශේෂය රු.69,755 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු. 6,810,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ශේෂයේ රු. 6,740,245 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් අයිතමයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | අයිතමය | වටිනාකම (රු.000) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය | 69,783,696 | • ආයෝජනය කිරීම සඳහා නිර්දේශයන්, ආයෝජන කමිටු හා මුදල් මණ්ඩල අනුමැතීන් |
| (ii) | කොටස් ආයෝජන - ලැයිස්තුගත | 74,042,107 | • කොටස් ලේඛනය<br>• අංශ අනුව දැක්වෙන උපලේඛන |
| (iii) | කොටස් ආයෝජන - ලැයිස්තුගත නොවන | 10,270,625 | • කොටස් සහතික<br>• කොටස් ලේඛනය<br>• අංශ අනුව දැක්වෙන උපලේඛන<br>• ශේෂ තහවුරු කිරීම් |
| (iv) | ස්ථාවර තැන්පතු | 48,000,000 | • ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට මුදල් මණ්ඩලය විසින් විශේෂ අනුමැතිය ලබාදුන් මුදල් මණ්ඩල පත්‍රිකාව<br>• ශේෂ තහවුරු කිරීම්<br>• ආයෝජන කමිටු තීරණ |
| (v) | ණයකර | 5,349,207 | • ණයකර සහතික<br>• ආයෝජන කමිටු හා මුදල් මණ්ඩල අනුමැතීන් |

| | | | |
|---|---|---|---|
| (vi) | භාර සහතික | 2,746,076 | • භාර සහතිකපත්<br>• ආයෝජන කමිටු හා මුදල් මණ්ඩල අනුමැතීන්<br>• ශේෂ තහවුරු කිරීම් |
| (vii) | වෙනත් ආදායම් - අධිභාර හා කම්කරු දෙපාර්තමේන්තුව | 587,600 | • විස්තරාත්මක උපලේඛන |
| (viii) | දේපල, පිරියත හා උපකරණ (පිරිවැය) | 309,219 | • ස්ථාවර වත්කම් ලේඛනය |
| (ix) | මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු - "මෙහෙවර පියස" මුදල් | 377,147 | • ශේෂ තහවුරු කිරීම් |
| (x) | කම්කරු කොමසාරිස් ජනරාල්-අග්‍රිමය | 534,034 | • ශේෂ තහවුරු කිරීම්<br>• උපලේඛන |
| (xi) | ගෙවිය යුතු ප්‍රතිලාභ | 170,999 | • විස්තරාත්මක උපලේඛන |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සේවක අර්ථසාධක අරමුදලට අනුයුක්ත කර සිටින ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සේවා නියුක්ති ආදායම මත වූ උපයන විට බදු ගෙවීම් අදාල නිලධාරීන්ගෙන් අය නොකර සමාලෝචිත වර්ෂයේ දී රු. 17,915,000 ක් අරමුදල විසින් ගෙවා තිබුණි. 2016 අයවැය ලේඛනයේ උපදෙස් හා රාජ්‍ය මුදල් චක්‍රලේඛවලට අනුකූල වන ලෙස, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සමග සාකච්ඡා කොට ඒ සඳහා නිවැරදි ක්‍රමවේදයන් හා යාවත්කාලීන කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙස 2016 පෙබරවාරි 26 දිනැති රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී දන්වා තිබුනද 2018 ජුලි අවසන් වන විටත් එවැනි වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මුදල් රෙගුලාසි 395 (ආ) හා (ඇ) | අරමුදලේ සෘජු හර හා බැර කිරීම් සඳහා පවත්වාගෙන යන බැංකු ගිණුමට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 570 | මෙහෙවර පියසඝ ගොඩනැගිල්ල වෙනුවෙන් ලැබී තිබූ රු. 813,686 ක අත්තිකාරම් සහ කොන්ත්‍රාත් හා වෙනත් ගිවිසුම්වලට අදාළව රඳවාගත් මුදල් රු.450,530 ක් පිළිවෙලින් වසර 03 ක් හා වසර 02 ක් ගතවී තිබුණද නිරවුල් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුම් 2 ක රඳවා තිබුණි. |
| (ඇ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ පවතින රු. 185,330,000 ක් වූ දේපල පිරියත හා උපකරණවලට අදාල 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ සිදුකර එහි වාර්තා විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. |
| (ඈ) කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ<br>(i) 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 15/2007 දරන චක්රලේඛයේ 3.1 වගන්තිය | මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරීන් විසින් ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකළ දින සිට දින 10 ත් දින 30 ත් අතර ප්‍රමාද කාලයන් සහිතව පරීක්ෂණ වාර්තා භාරදී තිබූ අවස්ථා 86 ක්ද දින 30 ඉක්මවූ ප්‍රමාද කාලයන් සහිතව පරීක්ෂණ වාර්තා භාරදී තිබූ අවස්ථා 284 ක්ද පැවතුණි. |
| (ii) 2002 මැයි 20 දිනැති අංක 08/2002 දරන චක්‍රලේඛය | ලියාපදිංචි අංකය, ආයතනයේ නම, ලිපිනය, ව්‍යාපාරයේ ස්වභාවය, සේවක සංඛ්‍යාව හා අවසන්වරට පරීක්ෂා කළ දිනය ඇතුළත් ආයතන ලේඛනයක් නඩත්තු කිරීමට මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලය හා මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. |
| (iii) 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 දරන චක්‍රලේඛය | 2016 ජුනි සිට 2017 ජුලි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව සිදුකළ නියැදි පරීක්ෂාවේදී මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලය විසින් ප්‍රථම නිවේදන යවා දින 14 ක් ඉක්මවා තිබුණද රතු නිවේදන නිකුත් කර නොතිබූ අවස්ථා 33 ක්ද රතු නිවේදන යැවීමට දින 27 සිට දින 283 දක්වා කාලයක් ගතකර තිබූ අවස්ථා 67 ක්ද පැවති බව අනාවරණය විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 202,947 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.මිලියන 175,927 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලාභයෙහි රු.මිලියන 27,020 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී පොළී ආදායම් රු.මිලියන 22,861 කින් වැඩිවී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.මිලියන 125,610 ක් වූ අරමුදලේ ශුද්ධ ලාභය සමාලෝචිත වර්ෂය වනවිට රු.මිලියන 202,947 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. තවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම්වලට අදාල ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු. මිලියන 136,299 ක් වූ අරමුදලේ දායකත්වයද සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 222,730 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**3.2 අරමුදල විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

අරමුදල විසින් රු. 10,050,779,371 ක දායක මුදල් හා අධිභාර අයකර ගැනීම වෙනුවෙන් බාහිර ආයතනවලට එරෙහිව 2017 දෙසැම්බර් 31 දිනට දිවයින පුරා පිහිටි අධිකරණවල නඩු 9030 ක් ගොනුකර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, අරමුදලේ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් රු. මිලියන 8 ක් ඇස්තමේන්තු කර රූපවාහිනී දැන්වීමක් නිර්මාණය කිරීම හා රූපවාහිනී නාලිකා 2 ක් මගින් මාසයක් පුරා දැන්වීම් වාර 80 ක් ප්‍රචාරණය කිරීම සඳහා සැලසුම් කර තිබූ නමුත් රූපවාහිනී දැන්වීමක් නිර්මාණය කිරීම පමණක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර තිබුණි.

(ආ) ඡායාරූප හා ඇඟිලි සලකුණු ලබා ගැනීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 17 ක් ඇස්තමේන්තු කර සාමාජිකයින් 100,000කගේ ඇඟිලි සලකුණු ලබා ගැනීමට සැලසුම්කර තිබුනද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර දෙපාර්තමේන්තු නිළධාරීන් 50,000 කගේ ඇඟිලි සලකුණු ලබා ගැනීමට සැලසුම් කර තිබුණද නිලධාරීන් 12,600 කගේ පමණක් ඇඟිලි සලකුණු ලබාගෙන තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකු සේවක අර්ථසාධක අරමුදල් අංශයේ 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, ආයෝජනයන් හා අරමුදල් කළමනාකරණය සම්බන්ධව පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීම, තොරතුරු තාක්ෂණ අංශයේ සහයෝගය ඇතිව ගිණුම්කරණ හා ආයෝජන මෘදුකාංගය (SAP System) දියුණු කිරීම, සේවක අර්ථසාධක අරමුදලේ නව පහසුකම් පිළිබඳව රූපවාහිනී හා පුවත්පත් දැන්වීම් ප්‍රචාරය කිරීම සහ සේවායෝජකයින්ගේ හා සේවා දායකයින්ගේ මඟපෙන්වීම සඳහා විස්තරාත්මකව යාවත්කාලීන කළ අත්පොතක් ප්‍රකාශයට පත් කිරීම යන කාර්යයන් ඉටු කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

**4.2 අරමුදල් ආයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "2015 පෙබරවාරි 01 දින සිට 2016 මාර්තු 31 දක්වා කාලපරිච්ඡේදය තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව පරීක්ෂා කිරීමේ සහ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිසන් සභා වාර්තාවේ" පරිච්ඡේද අංක : 32 - "Determination and Report on issues stated in the Mandate" (පිටු අංක 880 - 910) යටතේ Perpetual Treasuries සමාගම විසින් භාණ්ඩාගාර බැඳුම්කර 07 කට අදාල ගනුදෙනුවලින් මුළු ශුද්ධ මුදල් ලැබීම් රු.11,145,221,480 ක් ලබා ගෙන තිබූ බව දක්වා තිබුණු අතර ඉන් රු. 8,529,964,496 ක ශුද්ධ මුදල් ලැබීම් සේවක අර්ථසාධක අරමුදල ද ඇතුළත් රාජ්‍ය ආයතන හරහා ලබා ගෙන තිබූ බව සඳහන් කර තිබුණි.

එම වාර්තාවේ පරිච්ඡේද අංක: 33 හි 15 වන (පිටු අංක : 911 – 922) නිර්දේශය පරිදි සේවක අර්ථසාධක අරමුදල එළඹෙන ලද ගනුදෙනු පිළිබඳ මුදල් මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව සිදුකරන විමර්ශනයේදී සේවක අර්ථසාධක අරමුදලට යම් අලාභයක් සිදුව ඇති ද යන්න හා එසේ නම් ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සහ එම වගකිව යුතු නිලධාරීන්ගෙන් එම අලාභය අයකර ගැනීම යනාදිය පිළිබඳව මැනවින් පරීක්ෂාකිරීම අපේක්ෂා කර තිබුණි. එසේම සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් ගනුදෙනුවලට එළඹීම සඳහා වරප්‍රසාද ලබා ඇත්තේ කවුරුන්ද හා වංක ලෙස ක්‍රියා කර ඇති පුද්ගලයන් කවුද යන්න පිළිබඳව සලකා බැලීමටද නිර්දේශ කර තිබුණි.

(ආ) අරමුදල සහ වෙනත් රාජ්‍ය ආයතන දෙකක් එක්ව රු.බිලියන 12 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ අලුතින් ඉදිකිරීමට යෝජිත හෝටල් සංකීර්ණ සමාගමක ආයෝජන කටයුත්තක් ආරම්භ කර තිබූ අතර 2013 වර්ෂය අවසානයේදී අරමුදලෙන් රු.බිලියන 5 ක් ඒ සඳහා යොදවා තිබුණි. ඒ වෙනුවෙන් 2013 ජුනි 04 දින අත්සන් කරන ලද කොටස් හිමියන්ගේ ගිවිසුම අනුව, මෙම සමාගමේ කොටස් 2015 වර්ෂය අවසන් වීමට පෙර කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමට තීරණය කර තිබූ නමුත්, ඉදිකිරීම් ප්‍රමාදවීම හේතුවෙන් එම කටයුතු 2018 ජුනි අවසන් වන විටත් අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් ආයෝජිත දින සිට අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාගේ අදහස් දැක්වීම අනුව අදාළ සමාගමේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා විකුණා දැමීමට රජය තීරණය කොට ඇති බව අදාළ හෝටල් සමාගම විසින් දන්වා ඇති බව සඳහන් කර තිබුණි.

(ඇ) අරමුදල විසින් Sri Lankan Air Lines, The Finance Company PLC සහ Galadari Hotels (Lanka) PLC යන සමාගම්වල කොටස් මිලියන 31 ක රු.මිලියන 1,516 ක් ආයෝජනය කර තිබූ අතර ආයෝජනය කරන ලද දින සිටම කිසිදු ප්‍රතිලාභයක් අරමුදලට ලැබී නොතිබුණි. තවද 2017 දෙසැම්බර් 31 දිනට එම ආයෝජනවල වෙළඳපොල අගය රු.මිලියන 216 ක් වූයෙන් ගණනය කරන ලද හානිකරණ අලාභය රු.මිලියන 1,300 වූ අතර Sri Lankan Air Lines සහThe Finance Company යන සමාගම්වල ආයෝජනයන් සිදු කරන විටත් ඒවා අලාභ ලබමින් පැවති සමාගම් බව විගණනයට අනාවරණය විය.

(ඈ) අරමුදල විසින් 2013 වර්ෂයේදී PC House සමාගමේ කොටස් මිලියන 11 ක රු.මිලියන 44 ක් ආයෝජනය කර තිබුණද ආයෝජනය කරන ලද දින සිටම අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබූ අතර එම ආයෝජනය සිදු කරන විටත් සමාගම අලාභ ලබමින් පැවති බව අනාවරණය විය. තවද 2016 වර්ෂයේදී එම කොටස් විකිණීම හේතුවෙන් අරමුදලට රු.මිලියන 43 ක තථ්‍ය අලාභයක් සිදු වී තිබුණි.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය තුළදී බටහිර කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් කීපදෙනෙකු විසින් වංචා සහගත ලෙස රාජ්‍ය බැංකුවක් හරහා සාමාජිකයින් 63 දෙනෙකුට සේවක අර්ථසාධක අරමුදල් ඇපයට තබා නිවාස ණය ලබාදීමට කටයුතු කර තිබුණි. එහිදී නිකුත් කරන ලද සේවක අර්ථසාධක අරමුදල් නිවාස ණය ඇප ශේෂ සහතික වල මුළු වටිනාකම රු. 63,169,974 ක් විය.

(ආ) 2012 අංක 02 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනතේ 23 (අ) වගන්තියට අනුව, පනතේ අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන සාමාජිකයින්ට තමාගේ සාමාජික මුදල් ලෙස බැරට තැන්පත්ව ඇති මුදලින් සියයට 30 ක් නිවාස හා වෛද්‍යාධාර ප්‍රතිලාභ ලෙස ලබාදීම 2015 මැයි මාසයේ සිට ආරම්භ කර තිබුණි. ඒ අනුව, පූර්ව ප්‍රතිලාභ ගෙවීම් ලෙස 2015 සිට 2017 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 58,300 ක් ගෙවා තිබුණි.

කෙසේ වුවද, සාමාජිකයින් විසින් මෙමගින් නිදහස් කරගන්නා දායක මුදල් එකී කාර්යයන් සඳහාම යොදාගනු ලබන්නේ ද යන්න පිළිබඳව පසුවිපරම් කිරීමට අවශ්‍ය නෛතික ක්‍රියාවලිය ඉහත සංශෝධිත පනත මගින් දක්වා නොතිබීමෙන් එම දායක මුදල් වෙනත් කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේ හැකියාවක් තිබිය හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව අනුව, 2017 වර්ෂය අවසාන වනවිට පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිය ලෙස වාර්තා වී තිබුණු 3,799,628 දෙනෙකුගෙන් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය ලබාගෙන තිබුණු සක්‍රීය සාමාජික සංඛ්‍යාව 2,626,169 දෙනෙක් හෙවත් සියයට 69 ක් විය. අනෙකුත් අනුමත අර්ථසාධක අරමුදල්වල සාමාජිකත්වය දරන සේවක සංඛ්‍යාව සියයට 11 ක් පමණක් වීමෙන් ඉතිරි සියයට 20 ක් වූ ප්‍රමාණය කිසිදු අරමුදලකට දායකත්වයක් දරා නොතිබූ අතර එම සේවා නියුක්තයින් සඳහා අරමුදලේ සාමාජිකත්වය ලබා දීම කෙරෙහි අවධානය යොමුව නොතිබුණි.

## 4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව, නියමිත දිනට දායක මුදල් නොගෙවන සේවායෝජකයන්ගෙන් එම ප්‍රමාද කාලය වෙනුවෙන් අධිභාර ගණනය කළ යුතුය. එහෙත් ශ්‍රී ලංකා මහ බැංකු දත්ත සමුදාය පද්ධතිය ආශ්‍රයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී, මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අදාල ආයතන සම්බන්ධයෙන් 2000 වර්ෂයේ සිට 2017 සැප්තැම්බර් මාසය දක්වා කාල සීමාව සඳහා සේවායෝජක ආයතන 8 කින් ප්‍රමාද කාලය වෙනුවෙන් රු. 39,392,187 ක අධිභාර මුදලක්ද මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අදාල ආයතන සම්බන්ධයෙන් සේවායෝජක ආයතන 14 කින් 2017 ඔක්තෝබර් 25 දිනට රු. 119,850,759 ක අධිභාර මුදලක් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබූ බව අනාවරණය විය

(ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 14 වගන්තිය ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් අවුරුද්දකට සියයට දෙක හමාරකට නොඅඩු පොලියක් අරමුදලේ මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායමෙන් වාර්ෂිකව එක් එක් සාමාජිකයින්ගේ ගිණුම්වලට බැරකළ යුතුය. 2017 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල එලෙස ගෙවන ලද පොළී ප්‍රතිශතයන් සැලකිල්ලට ගැනීමේ දී 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සියයට 13.75 සිට සියයට 10.5 ක් දක්වා ක්‍රමිකව පහත වැටී තිබූ අතර ඉකුත් වර්ෂ තුනකදී හා සමාලෝචිත වර්ෂයේදී එය සියයට 10.5 ක් බැගින් සමාන පොළී ප්‍රතිශතයක රඳවාගෙන තිබුණි.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

නිසි අවශ්‍යතා හඳුනාගැනීමෙන් තොරව වාර්ෂික ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් 2017 වර්ෂයේ දී වැය විෂයයන් 09 ක් වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් සියයට 13 ත් සියයට 80 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 4.6 ඌන උපයෝජිත වත්කම්

-----------------------------

2007 නොවැම්බර් මාසයේදී රු. 21,884,084 ක පිරිවැයක් දරා අරමුදල විසින් මුද්‍රණ යන්ත්‍රයක් මිලදීගෙන තිබූ නමුත් එහි උපරිම ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව බාහිර ආයතන ලවා මුද්‍රණ කටයුතු ඉටුකරවා ගෙන තිබූ අතර ABH ආකෘති පත්‍ර මුද්‍රණය සඳහා පමණක් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල එකතුව රු.32,324,470 ක් ගෙවා තිබුණි.-

**4.7** **වෙනත් රාජ්‍ය ආයතන වෙත මුදාහැර ඇති සම්පත්**

---------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල කම්කරු දෙපාර්තමේන්තුවට අයත් වාහන 16 ක අලුත්වැඩියා කිරීම් සඳහා අවස්ථා 23 කදී රු.1,298,638 ක වියදම් අරමුදලින් දරා තිබුණි.

**4.8** **කාර්ය මණ්ඩල පරිපාලනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවක අර්ථසාධක අරමුදලේ ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලයට මුදල් මණ්ඩලය මගින් අනුමත කාර්ය මණ්ඩලයක් නොවූ අතර, 2015 වර්ෂයේදී 159 දෙනෙකු වූ තථ්‍ය කාර්ය මණ්ඩලය සමාලෝචිත වර්ෂය අවසානයේදී 176 දෙනෙක් දක්වා වැඩි වී තිබුණි.

(ආ) 2017 වර්ෂය අවසානය වනවිට අරමුදලට අදාලව කම්කරු දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 303 ක් ද සත්‍ය කාර්ය මණ්ඩලය 200 ක් වූ අතර ඒ අනුව පුරප්පාඩු 103 ක් පැවතුණි. පුරප්පාඩු කාර්ය මණ්ඩලය මාණ්ඩලික ශ්‍රේණියේ 9 දෙනකුගෙන් හා මාණ්ඩලික නොවන ශ්‍රේණියේ 93 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ජ්‍යෙෂ්ඨ තනතුරුවල පුරප්පාඩු පැවතීම අරමුදල් නිරවුල් කිරීම්, නීතිමය ක්‍රියා මාර්ග ගැනීම් ඇතුළු අරමුදලේ පරිපාලන කටයුතු ප්‍රමාද වීම කෙරෙහි සෘජුවම බල නොපෑවේය යන්න විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

(ඇ) 2017 හා 2016 වර්ෂයන්ට අදාලව අරමුදලේ ඒක සේවක පිරිවැය පහත දැක්වේ.

| | 2017 වර්ෂය | | 2016 වර්ෂය | |
|---|---|---|---|---|
| | කම්කරු දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා මහ බැංකුව | කම්කරු දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා මහ බැංකුව |
| වැටුප් පිරිවැය (රු'000) | 387,855 | 459,475 | 383,175 | 477,974 |
| තථ්‍ය සේවක සංඛ්‍යාව | 805 | 176 | 812 | 184 |
| ඒක සේවක පිරිවැය (රු'000) | 482 | 2,611 | 472 | 2,598 |
| ඒක සේවක පිරිවැයේ වෙනස (රු'000) | 2,129 | | 2,126 | |

සේවක අර්ථසාධක අරමුදලේ කම්කරු දෙපාර්තමේන්තුවේ ඒක සේවක පිරිවැය සමඟ සසඳා බලන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ ඒක සේවක පිරිවැය 2016 වර්ෂයේදී රු.2,126,000 කින්ද, 2017 වර්ෂයේදී රු.2,129,000 කින් ද, වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය. මීට ප්‍රධාන වශයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වැටුප් අතර පවත්නා වැටුප් විෂමතා බලපා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සේවක අර්ථසාධක අරමුදල විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාගේ අදහස් දැක්වීම අනුව ශ්‍රී ලංකා මහ බැංකුව ආයතනයක් වශයෙන් මේ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග ඉටු කරගෙන යනු ලබන බවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවක් වන සේවක අර්ථසාධක අරමුදලෙහි කාර්යයන් එහි අරමුණු හා සෘජුව සම්බන්ධ නොවන බවත් දන්වා තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1 විගණන කමිටු

අරමුදලට අදාලව විගණන කමිටු රැස්වීම් කම්කරු අමාත්‍යාංශය යටතේ සියලු ආයතන හා එක්ව පවත්වනු ලැබේ. ඊට අමතරව කම්කරු දෙපාර්තමේන්තුව යටතේ වෙනම විගණන කමිටුවක් පැවැත්වුවද, ඊට අරමුදලේ මූල්‍ය පරිපාලන කටයුතු සිදු කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව හා එහි අභ්‍යන්තර විගණකයින්ගේ සහභාගිත්වයක් නොතිබුණි. රු.බිලියන 2,066 ක් පමණ ඇති මෙම අරමුදල වෙනුවෙන් වෙනම විගණන කමිටුවක්, අරමුදලේ කටයුතු සඳහා අනුයුක්තකර සිටින කම්කරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත.

## 6.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබූ නමුත් 2006 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ඡේදය ප්‍රකාරව එය කාලීනව සමාලෝචනය කර නොතිබූ අතර එය කළමනාකරණ මෙවලමක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. තවද A හා H පත්‍ර පරිගණකගත කිරීම හා පරිලෝකනය කිරීමේ සේවාව, ABH ආකෘති පත්‍ර හා ණය 14 ආකෘතිපත්‍ර මුද්‍රණය කර ගැනීම සහ නිවාස ණය ආකෘති පත්‍ර හා අනෙකුත් ආකෘති පත්‍ර මුද්‍රණය කර ගැනීම යන රු. 27,041,800 ක වටිනාකමක් සහිත ප්‍රසම්පාදන කාර්යයන් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව, සියළුම ප්‍රසම්පාදන කාර්යයන් පළමු කාර්තුවේ ආරම්භ කර දෙවන කාර්තුවේ අවසන් කිරීමට සැලසුම්කර තිබූ නමුත් බොහෝ කාර්යයන්

සැලසුම්කළ පරිදි පළමු වන කාර්තුවේ ආරම්භ කර නොතිබූ බැවින් දෙවන කාර්තුවේදී අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. වාර්ෂික ඇස්තමේන්තුව තුළ ප්‍රතිපාදන වෙන්කර තිබියදීත් ප්‍රසම්පාදන කාර්යයන් කාර්යක්ෂම ලෙස සැලසුම් නොකිරීම හේතුවෙන් වැඩි මිලදී ගැනීම් ප්‍රමාණයක් වර්ෂයේ අවසන් මාසයේදී සිදුකර තිබුණි.

(ඇ) කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය විසින් 2017 වර්ෂය තුළ සිදුකර තිබූ ප්‍රසම්පාදන කාර්යයන් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු පහත දැක්වේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 ඡේදය අනුව, එක් එක් ප්‍රසම්පාදන කාර්යයන් වෙනුවෙන් ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබූ අතර ඒ හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 (ආ) හා (ඇ) සහ 2.6.1 (අ) (i) ඡේද යටතේ දැක්වෙන ප්‍රසම්පාදන කමිටුවල සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල වගකීම් හා කාර්යය භාරයන් ඉටු කර නොතිබූ බව අනාවරණය විය. තවද, 2.11.1 , 2.11.2 හා 2.11.3 (අ) ඡේද අනුව, ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටුවල රැස්වීම් සඳහා දින නියම කිරීම, පැමිණීමේ ලේඛන පවත්වා ගැනීම හා රැස්වීම් වාර්තා නිශ්චිත ආකෘතියට අනුව පිළියෙල කිරීම සිදුකර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 ඡේදය අනුව, මුල් පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබූ නමුත් අදාළ සියළු පිරිවැය ඒ තුළ ඇතුළත් කර නොතිබූ බැවින් මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 ඡේදය ප්‍රකාරව එය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කිරීම ද සිදුකර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 ඡේදය අනුව, ලංසු කැඳවීමේ ආරාධනාවල ජයග්‍රාහී ලංසුකරුට තිබිය යුතු සෘජුවම සුදුසු බව තහවුරු කෙරෙන උපමාන සහ සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා ඇතුළත් කර නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය අනුව, ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ අවම කාලසීමාව දින 21 ක් වුවද ඒ යටතේ සිදුකල ප්‍රසම්පාදන කාර්යයන් 8 කදී ලංසු ඉදිරිපත් කිරීමට දින 21 ට වඩා අඩු කාලසීමා ලබාදී තිබුණි.

(ඈ) අරමුදලේ A හා H පත්‍ර පරිගණකගත කිරීම හා පරිලෝකනය කිරීමේ ප්‍රසම්පාදන කාර්යය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4.1 ඡේදය අනුව, ලංසු ඇගයීම හැකිතාක් ඉක්මනින් සිදුකළ යුතු අතර ප්‍රසම්පාදන අත්පොතේ 7 වන පරිච්ඡේදය අනුව ලංසුවල වලංගු කාලයෙන් සාමාන්‍යයෙන් සියයට 50 ක කාලයක් ඇතුළත තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම අවසන් කළ යුතුය. ඒ අනුව ඉහත ලංසු ඇගයීම දින 45 ක කාලයක් තුළ සම්පූර්ණ කළ යුතු වුවද ඒ සඳහා දින 210 ක පමණ දීර්ඝ කාලයක් ගත කර තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.7.1 (ආ) ප්‍රකාරව ලංසු පරීක්ෂා කිරීම හා විස්තරාත්මක ලංසු ඇගයීම සිදු කර නොතිබූ බව තාක්ෂණික ඇගයීම් වාර්තා පරීක්ෂාවේදී අනාවරණය විය. එසේම ලංසු ඇගයීමේදී තාක්ෂණික කරුණු ඇගයීමට ලක් කිරීමට වඩා වැඩි අවධානයක් කම්කරු නීති අනුගමනය කිරීම යන කාරණයට ලබාදී තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.19 (ආ) ඡේදය ප්‍රකාරව පශ්චාත් සුදුසුකම් ලැබීමේ උපමාන ලංසු කැඳවීමේ ලේඛනවල පැහැදිලිව සඳහන් කලයුතු වුවත් එපරිදි කටයුතු කිරීමකින් තොරව තෝරාගත් ලංසුකරුට පමණක් ප්‍රායෝගික පරීක්ෂාවක් සඳහා අවස්ථාව ලබාදී තිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10.1 (ආ) ඡේදය අනුව, ලංසුකරුට කොන්ත්‍රාත්තුව ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය හැකියාව හා සම්පත් ඇති බවට තහවුරු කිරීම අවශ්‍ය වුවද, ඉහත සේවාව සැපයීම සඳහා තෝරාගත් ආයතනය සතු දෘඩාංග, මෘදුකාංග සහ තාක්ෂණික දැනුම ඇති කාර්යය මණ්ඩලය යනාදී සම්පත්වල ප්‍රමාණවත් බව හා යෝග්‍යතාව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් කර තිබූ බව, තාක්ෂණික ඇගයීම් වාර්තාව අනුව තහවුරු නොවුණි.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 ඡේදය අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම් වාර්තාවක් පිළියෙලකර නොතිබුණි.

(vi) දත්ත පරිගණකගත කිරීමේදී සියයට 99.8 ක නිවැරදිතාවයක් ඇතිව කටයුතු කිරීමේ හැකියාව ලංසුකරුට තිබිය යුතු බව පිරිවිතරවල දක්වා තිබුණි. නමුත් හැකියාව පරීක්ෂා කළ අවස්ථා දෙකකදීම අධික වැරදි සංඛ්‍යාවක් සහිතව දත්ත පරිගණකගත කර තිබූ අතර, එක් අවස්ථාවක දී සියයට 10 ක පමණ වැරදි සහිතව දත්ත පරිගණකගත කර තිබූ, නමුත් එම ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරාගෙන තිබුණි. පිරිවිතර අනුව අවම වශයෙන් මාසිකව 40,000 ක් වූ A හා H පත්‍ර සංඛ්‍යාවක් පරිගණකගත කිරීම හා Scan කිරීම සිදුකළ යුතු වුවද 2017 අප්‍රේල් 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ මාසිකව 28,622 ක ප්‍රමාණයක් පමණක් සම්පූර්ණ කර තිබුණි. එම අකාර්යක්ෂම සේවා සැපයීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට 400,000 කට ආසන්න A හා H පත්‍ර ප්‍රමාණයක් පරිගණකගත කිරීම හා Scan කිරීම සිදු නොකර මධ්‍යම ලිපිගොනු අංශයේ ගබඩාව තුළ රඳවා තබා තිබුණි.

(vii) නිසි සැලසුමකින් තොරව කටයුතු කිරීම හා උක්ත ප්‍රසම්පාදන කාර්යයේ ප්‍රමාදය හේතුවෙන් ඉකුත් වර්ෂයේ A, B, H, I හා J පත්‍රිකා පරිගණකගත කිරීමේ හා පරිලෝකනය කිරීමේ (Scan) සේවාව සැපයූ ආයතනයෙන් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව 2016 අප්‍රේල් 01 සිට 2017 මාර්තු 31 දක්වා කාලය තුල එම සේවාව ලබාගෙන ඒ සඳහා රු. 3,978,800 ක් ගෙවා තිබුණි. ඉදිරියේදී දිස්ත්‍රික් කම්කරු කාර්යාල මට්ටමින් මෙම කාර්යය ඉටුකර ගැනීම සඳහා අදාළ දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල දත්ත පරිගණකගත කිරීමේ ලිපිකරුවන් පුහුණු කිරීම සඳහා සැලසුමක් සකස් කිරීමට 2016 සැප්තැම්බර් 26 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබූ නමුත් එම යෝජනාව කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොමැති බව විගණනයේ දී අනාවරණය විය.

(ඉ) අරමුදලේ ABH ආකෘති පත්‍ර මුද්‍රණය කර ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන කාර්යය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.1 (අ) ඡේදය ප්‍රකාරව, පිරිවිතර හා ලංසු ලේඛන පිළියෙල කර නොතිබූ අතර ඒ හේතුවෙන් මිල ගණන් ඉහල දැමීම, කාර්යසාධන ඇපකරය සම්බන්ධයෙන් සහනයක් ඉල්ලීම හා අත්තිකාරම් ඉල්ලීම ආදී කොන්දේසි කිහිපයක් ඉදිරිපත් කර තිබූ ලංසුකරුවකු ජයග්‍රාහී ලංසුකරු වශයෙන් තෝරා ගැනීමට සිදු වී තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10.1 (ආ) ඡේදය ප්‍රකාරව ලංසුකරුට ඇති හැකියාව සහ ඔවුන්ගේ පූර්ව සුදුසුකම් හා පළපුරුද්ද තාක්ෂණික ඇගයීම් කමිටුව ඇගයීම් කර නොතිබූ අතර 2018 ජනවාරි 31 දින වන විට රු. 6,387,500 ක පිරිවැයක් යටතේ සම්පූර්ණ ABH ආකෘති පත්‍ර 800,000 ම සැපයීමට ගිවිසුම්ගත වී තිබුණි. එහෙත් 2018 මාර්තු 02 දින වන විටද සපයා තිබුණේ ආකෘති පත්‍ර 208,000 ක් පමණක් වූයෙන් හිඟය අවම කර ගැනීම

සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව පෙර වර්ෂයේ මුද්‍රණ ඇණවුම් ලබාදී තිබූ ආයතනය මගින් රු. 799,000 කට ABH ආකෘති පත්‍ර 100,000 ක් මුද්‍රණය කරවා ගෙන තිබුණි.

(ඊ) සාමාජිකයන්ගේ ඡායාරූප හා ඇඟිලි සලකුණු ලබා ගැනීමේ ව්‍යාපෘතිය (3 වන අදියර)

---

සාමාජිකයින්ට කාර්යක්ෂම හා විශ්වාසදායී සේවාවක් ලබාදීමේ අරමුණින් උක්ත ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියරයන් පිළිවෙලින් 2008/2009 හා 2010/2011 වර්ෂයන්හිදී ක්‍රියාත්මක කර තිබූ අතර තෙවන අදියර 2015 දී ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පිරිවැය - ප්‍රතිලාභ විග්‍රහයක් (Cost - Benefit analysis) හා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර, මනා සැලසුමක් යටතේ ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියරයන් ආරම්භ කර නොතිබූ අතර, ව්‍යාපෘතියේ තෙවන අදියරට අදාළ ව්‍යාපෘති වාර්තාවක් හා ව්‍යාපෘති සැලසුමක් විගණනයට ඉදිරිපත් නොවීය. තවද තෙවන අදියර ක්‍රියාත්මක කිරීමට පෙර පළමු හා දෙවන අදියරයන්ගේ ප්‍රගතිය සමාලෝචනය කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) ව්‍යාපෘතියේ තෙවන අදියර කොටස් 2 කින් ඉටුකිරීමට පිරිවිතර සකස් කර තිබූ අතර, I කොටස යටතේ අදාළ උපකරණ මිලදී ගැනීම හා II කොටස යටතේ ඡායාරූප හා ඇඟිලි සලකුණු ලබාගැනීමට (Data Capture) නියමිතව තිබූ අතර ව්‍යාපෘතියේ තෙවන අදියරෙහි කොටස් දෙකම එකම ආයතනයකින් ඉටුකර ගැනීමට ලංසුකරුවකු තෝරාගෙන තිබුණි. ඒ අනුව 2017 මැයි 15 දින උපකරණවලින් කොටසක් රු. 16,557,085 ක් වැයකර 2017 මැයි 15 දින මිලදීගෙන තිබුණද ව්‍යාපෘතියේ II වන කොටස සම්බන්ධයෙන් ඒ අනුව විධිමත් පරිදි ඇස්තමේන්තු සකස් කර නොතිබීම, ලංසුකරුවන්ගේ හැකියාව ඇගයීමට ලක් කිරීම සඳහා ඇගයීම් උපමාන හඳුනාගෙන ඒ අනුව ඇගයීම් කටයුතු සිදු නොකිරීම, සම්මුති සාකච්ඡාවලදී එකඟ වූ කරුණු සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම් අත්සන් කර නොතිබීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගිවිසුමකට නොඑළඹීම යන හේතු නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිව පැවති අතර 2018 මැයි 31 දින වනවිටත් ඉහත උපකරණ ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතුණි.

(iii) ලංසු ලේඛන අනුව, අදාළ උපකරණ සැපයීම, සවිකිරීම හා ක්‍රියාත්මක කිරීම මත සියයට 90 ක් ද ඉතිරි සියයට 10 සාමාජිකයින් 1000 කගේ ඡායාරූප හා ඇඟිලි සලකුණු ලබාගැනීමෙන් පසුවද වශයෙන් ගෙවීම් කළ යුතු වුවද උපකරණ සැපයීම පමණක් සිදුකර තිබියදී උපකරණවල මුළු වටිනාකම වූ රු. 16,557,085 ක මුදල එකවර ගෙවීම් කර තිබුණි.

(iv) නිසි අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් හා සැලසුම් සකස් කිරීමෙන් තොරව ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඉහත ව්‍යාපෘතිය වෙනුවෙන් වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් සියයට 85 සිට සියයට 100 ක ප්‍රමාණයක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබූ අතර සියයට 15 සිට සියයට 100 දක්වා ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) ඡේදය අනුව, විෂය පිළිබඳ විශේෂඥයෙකුගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත නොවීම හේතුවෙන් උපකරණවල (භාණ්ඩ හා මෘදුකාංග) අනුකූලතාවය හා ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍රයේ විශේෂඥයෙකුගේ සහාය ලබා ගැනීමට සිදු වී තිබුණි.

(vi) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 ඡේදය අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම් වාර්තාවක් පිළියෙල කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 6.3 අභ්‍යන්තර විගණනය

සේවක අර්ථසාධක අරමුදලට ස්වාධීන වූ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැති අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු බාහිර විගණන ආයතනයක් ලවා ඉටු කරගෙන තිබුණි. අරමුදලේ පරිපාලන කටයුතු සිදුකරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 14 ක් හා තථ්‍ය සංඛ්‍යාව 08 දෙනෙකුට සීමාවී තිබුණි. දෙපාර්තමේන්තුව සතුව ප්‍රාදේශීය කාර්යාල 57 ක් පැවතීම හා සිදුවන ගනුදෙනුවල ප්‍රමාණය අනුව තත්‍ය සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීමෙන් අරමුදලේ විගණන කටයුතු සඳහා වැඩි අවධානයක් යොමුකර නොමැති බව නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළයුතු බවට 2013 වර්ෂයේ සිට දිගින් දිගටම රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීම් වලදී නියෝග කර තිබුණද, ඒ අනුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර විගණනයක් සිදු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 6.4 රාජ්‍ය ගිණුම්කාරක සභා නිර්දේශ හා වර්තමාන තත්ත්වය

| නිර්දේශ අංකය | නිර්දේශය හා වර්තමාන තත්ත්වය |
|---|---|
| (අ) 2016 පෙබරවාරි 26 අංක 08 | සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා සියලු ආයතන ඒකාබද්ධව ඉදිරි වසර 10 සඳහා විධිමත් සැළැස්මක් සකස් කලයුතු බවට උපදෙස් ලබා දී තිබුණ ද ආයතන 7 ක සහභාගිත්වයෙන් පැවති රැස්වීම් වලදී එක් එක් ආයතන පිහිටුවා ඇති අරමුණු වෙනස් බැවින් එම ආයතනවල පවතින දත්ත පද්ධති, ප්‍රතිලාභ ක්‍රම හා තොරතුරු තාක්ෂණ පද්ධති ඒකාබද්ධ කිරීමේ හැකියාවක් නොමැති බැවින් සේවක අර්ථසාධක අරමුදලේ දස වසරක ඉදිරි සැලැස්ම ක්‍රියාත්මක කිරීම උදෙසා සියළු ආයතන ඒකාබද්ධ කිරීමේ හැකියාවක් නොමැති බව අනාවරණය කරගෙන තිබුණි. |
| (ආ) 2016 පෙබරවාරි 26 අංක 09 | අරමුදලේ තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව හා මහ බැංකුව සම්බන්ධ වී එක් පරිගණක වැඩසටහනක් සකස් කිරීමේ හැකියාව පිළිබඳව වාර්තාවක් 2016 මාර්තු 23 දිනට පෙර කාරක සභාවට යොමු කරන ලෙස උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුව විසින් රජයට ලබාදෙන ණය ප්‍රතිපාදනයක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රාග්ධන වෙළඳපළ දියුණු කිරීමේ ව්‍යාපෘතිය (Capital Market Development Programme) යටතේ අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීමට එකඟතාවය පළකර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා විසින් විගණනයට දන්වා තිබුණි. |

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති පාලන අඩුපාඩු වරින්වර කම්කරු කොමසාරිස් ජනරාල් සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | සාමාජික ගිණුම් වලට දායක මුදල් බැර කිරීම | අරමුදලේ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැරවී නොමැති දායක මුදල් එම ගිණුම්වලට කඩිනමින් බැරකිරීමට හා රඳවාගත් ප්‍රතිලාභ අදාල හිමිකරුවන්ට අප්‍රමාදව ගෙවීමට වැඩ පිළිවෙලක් සකස් නොකිරීම. |
| (ආ) | ආයෝජන කළමනාකරණය | සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභයක් ලැබෙන පරිදි අරමුදල් ප්‍රශස්ත ලෙස ආයෝජනය නොකිරීම. |
| (ඇ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයට ප්‍රමාණවත් හා සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම හා සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සිදු නොකිරීම. |
| (ඈ) | බැංකු සැසඳුම් පිළියෙල කිරීම | දීර්ඝ කාලීනව නිරවුල් නොකල ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | ප්‍රසම්පාදනයන් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රසම්පාදනයන් ඉටු නොකිරීම. |